**මහියංගණය ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහියංගණය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහියංගණය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියෙන් (LDSP) ලැබී තිබුණු කර්මාන්ත ආධාර රු.60,189,965 ක් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | ඉඩම්වල අයිතිය සභාවට නොමැති බැවින් කර්මාන්ත සිදු කරන අවස්ථාවලදී LDSP ආධාර මුදල් පොතට හා තැන්පත් ගිණුමට ඇතුළත් කර ඇති බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.11,119,468 ක් වුවද එය රු.11,232,742 ක් ලෙස රු.113,274 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ශේෂ පිරික්සුමේ වෙනස දක්වමින් පිළියෙල කර තිබුණු අවිනිශ්චිත ගිණුමේ රු.914,881 ක බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | -එම- | ශේෂ පිරික්සුමේ ඇති වෙනස හඳුනාගන්නා තුරු තාවකාලිකව අවිනිශ්චිත ගිණුමක සටහන් කරන අතර, වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා ගෙවා තිබුණු රු.190,046 ක් පෙර ගෙවුම් ලෙස දක්වා තිබුණි. | 2024 වර්ෂයේ ආදායම් ඉපයීමට පුවත්පත් දැන්වීම් පළ කිරීම හේතුවෙන් ප්‍රචාරක දැන්වීම් වියදම පෙරගෙවුම් ලෙස දක්වා ඇති බව. | ගිණුම් වර්ෂයට අදාළ වියදම් හඳුනාගෙන නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා නොගත් පෙර ගෙවුම් රු.71,539 ක් දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී ගිණුම් තුළ ගැලපීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.2,033,067 ක් වුවද, එය රු.4,932,547 ක් ලෙස රු.2,899,480 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මුද්දර ගාස්තු ආදායම රු.1,033,321 ක් වුවද, එය රු.3,932,801 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | ලැබේ යැයි නිශ්චිතව හඳුනා නොගෙන වසර 15 ක පමණ කාලයක සිට පැවත එන ලැබීම් තහවුරු කිරීමට සාක්ෂි නොමැති එකතුව රු.120,185 ක් හිඟහිටි වෙනත් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්ත ණයහිමි ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව හා ලෙජරය අනුව ආරම්භක ශේෂ අතර රු.31,907 ක වෙනසක් සහ අවසාන ශේෂ අතර රු.438,311 ක වෙනසක් පැවතුණි. | 2024 වර්ෂයේදී ගැලපීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018, 2021 සහ 2023 වර්ෂ වලට අදාළව ගල් රෝල, මෝටර් ග්‍රේඩරය සහ ගලි බවුසර සේවා සැපයීම වෙනුවෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 522,475ක ශේෂය සනාථ කර ගැනීමට යන්ත්‍ර කුලී ලේඛනය හා ශේෂ සනාථන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | හිඟ ආදායමින් රු.218,800 ක් අයකරගෙන ඇති බව හා උපදෙස් අනුව ඉදිරියේදී ලේඛන නඩත්තු කරන බව. | ලේඛන විධිමත්ව නඩත්තු කර ආදායම් මාර්ගවල පැවැත්ම තහවුරු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 134(1) සහ 134(2) වගන්ති | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන සංවර්ධන මට්ටම් සැලකිල්ලට ගනිමින් වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු අයකර ගත යුතු වුවත් 2012 වර්ෂයේ තක්සේරුවක් පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි. | තක්සේරු වාර්තා ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවට සිහිකැඳවීම් ලිපි යොමු කර ඇති බව. | කාලීනව දේපළ තක්සේරු කර වරිපනම් බදු අය කරගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(4) | 2018, 2019 සහ 2020 වර්ෂවල වාහන 04කට අවස්ථා 08කදී සිදුව තිබුණු අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,399,724 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,317,436 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල්කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල්කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,086,655 | 4,537,638 | 4,357,517 | 180,121 | 5,566,445 | 4,527,539 | 4,759,863 | |
| (ii) | කුලී | 43,886,144 | 24,157,424 | 23,053,104 | 1,104,320 | 54,187,649 | 34,460,356 | 29,139,457 | 5,320,899 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,578,270 | 1,549,830 | 1,549,830 | 0 | 1,561,000 | 1,251,827 | 1,251,827 | 0 |
| (iv) | වෙනත් ආදායම් | 77,786,414 | 27,694,783 | 73,824,017 | 0 | 177,379,372 | 78,602,608 | 85,225,478 | 0 |
| | | 128,337,483 | 57,939,675 | 102,784,468 | 1,284,441 | 238,694,466 | 118,842,330 | 120,376,625 | 5,320,899 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වසර 03 කට අධික කාලයක සිට පැවත එන හිඟ වරිපනම් බදු රු.2,153,240 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.66,700 ක මුදලක් 2024 වර්ෂයේදී අයකර ගැනීමට හැකිය. | හිඟහිටි මුදල් අයකරගත යුතුය. |
| (ආ) | වසර 03 කට අධික කාලයක සිට සිට පැවත එන හිඟ හිටි ජල ගාස්තු රු.1,940,835 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | දඹාන ජල ව්‍යාපෘතිය වසා දමා ඇති අතර, දම්බරාව ජල ව්‍යාපෘතියේ විසන්ධි කර ඇති ජල ගිණුම්වලින් රු.12,822 ක් අයකරගෙන ඇති බව. | හිඟහිටි ජල ගාස්තු අයකරගත යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයන්ට අදාළව අයකර ගත යුතු වාර්ෂික මුළු ටෙන්ඩර් හිඟ බදු ආදායම රු.18,776,518 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාළව අයකර නොගත් ටෙන්ඩර් හිඟ බදු ආදායම රු.2,016,020 ක් අයකරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.5,816,980 ක් හා මුද්දර ගාස්තු රු.1,033,321 ක් ගෙන්වාගෙන නොතිබුණි. | උසාවි දඩ ගාස්තු රු.933,607 ක් ලැබී ඇති බව. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඉ) <u>හිඟ හිටි ටෙන්ඩර් ආදායම්</u>

| | | |
|---|---|---|
| බදු ගිවිසුම් අනුව මාසික බදු කුලිය ඊළඟ මස 10 දිනට පෙර අයකරගත යුතු වුවද, මහියංගණ නගරයේ ලංකා ගමනාගමන මණ්ඩලය අසළ පොදු වැසිකිළියේ හිඟ කුලී (2022 වර්ෂය) සඳහා රු.236,609 ක්, සෙනසුරාදා සතිපොළ කුලී (2022 වර්ෂය) සඳහා රු.4,479,950 ක්, මහියංගණය පෞද්ගලික බස් නැවතුම්පොළ වැසිකිළි කුලී (2022 වර්ෂය) සඳහා රු.603,646 ක් සහ සෙනසුරාදා සතිපොළ කුලී (2023 වර්ෂය) සඳහා රු.1,694,916 ක් ලෙස එකතු වටිනාකම රු.7,015,121 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිටද අයකරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)(i) | 2021 වර්ෂයේදී පළාත් සභා උපමාන පාදක සංවර්ධන වැඩසටහන යටතේ රු.3,559,082 ක් වැය කර ඉදිකර තිබුණු නව කෝම්පෝස්ට් අංගනය නිෂ්පාදන කටයුතු සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | කොම්පෝස්ට් ක්‍රියාවලිය 2024 මැයි සිට ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකළ යුතුය. |
| (ii) | නව කොම්පෝස්ට් අංගනය අවට දිරන සහ නොදිරන කසළ අක්‍රමවත් ලෙස විවෘත භූමියට බැහැර කර තිබුණු අතර, වැසි දිනවල සේදී ගොස් කසළ අංගනය ආසන්නයේ ගලා බසින මහවැලි ගඟට එකතුවීමේ තත්ත්වයක් පැවතුණි. | කසළ වෙන්කර ලබාගන්නා බව. | පාරිසරික ගැටළු අවම වන ආකාරයට කසළ විධිමත්ව බැහැර කළ යුතුය. |
| (ආ) | රු.13,665,854ක පිරිවැයක් දරා 2013 වර්ෂයේ කසළ ප්‍රතිචක්‍රීයකරණය සහ කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකර 2017 වර්ෂයේදී රු.18,846 ක පිරිවැයක් දරා විදුලි සම්බන්ධතාවය ලබාගෙන තිබුණි. එම ගොඩනැඟිල්ලද සමාලෝචිත වර්ෂය වනවිටත් අරමුණුගත කාර්ය සඳහා භාවිත නොකර නිෂ්කාර්යව පැවතුනි. | ගොඩනැඟිල්ල 2021 වර්ෂයේ සිට ටෙන්ඩර් මඟින් ලබාදී ඇති බව. | සම්පත් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීම වෙනුවෙන් යෙදවිය යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ. තෙල්දෙණියාය 19 කොටසට පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා අමුද්‍රව්‍ය ගෙන්වාගත හැකිව තිබුණු ආසන්නම ස්ථාන වලින් ලබා නොගැනීම හේතුවෙන් ප්‍රවාහන වියදම රු.25,778 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | කර්මාන්ත සඳහා වැඩිපුර ගෙවීම් නැවත අයකර ගත යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ තෙල්දෙණියාය පෙට්ටි කඩේ මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් අමුද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා වඩාත් වාසිදායක වන පරිදි පිරිවැය අවම වන ආකාරයට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු සකස් නොකර ගෙවීම් කිරීම හේතුවෙන් රු.47,517 ක් වැඩිපුර ගෙවා තිබුණි. | -එම- | -එම- |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් ට්‍රැක්ටර් රථය අලුත්වැඩියාව සඳහා 2019 වර්ෂයේදී මහියංගණය ප්‍රදේශයේ පෞද්ගලික ගරාජයකට භාරදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිටත් අලුත්වැඩියාවන් සිදු කර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරු උපදෙස් ලබාගෙන අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කරන බව. | වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් නිවාඩු නිකේතන ගොඩනැඟිල්ල අබලන් තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂයේ සිට වසා දමා තිබුණි. ගොඩනැඟිල්ල අලුත්වැඩියා කර අදාළ කාර්ය සඳහා යොදා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද ක්‍රියාකර නොතිබුණි.. ගොඩනැඟිල්ලේ මුර සේවය සඳහා සේවකයින් දෙදෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර, 2022 වර්ෂයේ සිට 2023 ජූලි දක්වා විදුලිය සහ ජලය වෙනුවෙන් රු.68,515 ක වියදමක් දරා තිබුණි. | අලුත්වැඩියා කර ආදායම් උත්පාදනයට යොදා ගැනීමට අපේක්ෂා කරන බව. | වියදම් කළමනාකරණය කරගත යුතුය. |
| (ඇ) | ප්‍රාදේශිය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ ඉකුත් වර්ෂයේදී කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් මිලදීගෙන තිබුණු එකතු වටිනාකම රු.3,337,500 ක් වූ හලර් යන්ත්‍රය, කැබලි කරන සහ වීදුරු තලන යන්ත්‍ර 2023 දෙසැම්බර් 31 දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | කොම්පෝස්ට් ක්‍රියාවලිය සඳහා විදුලි සම්බන්ධතාවය ලබාගෙන ඇති අතර, නිෂ්පාදන ක්‍රියාවලිය මැයි 15 දින ආරම්භ කරන බව. | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කරගත යුතුය. |

**3.4 ආදායම් ඉක්මවූ වියදම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බතලයාය සහ දඹාන ජල ව්‍යාපෘති වලින් 2023 වර්ෂයේ මුල් මාස 06 තුළ සභාවට රු.2,633,689 ක ආදායමක් ලැබී තිබුණු අතර, ජල ව්‍යාපෘති පවත්වාගෙනයාම වෙනුවෙන් විදුලිය සහ වැටුප් ඇතුළු වියදම් ලෙස රු.5,014,326 ක් වැය කර තිබුණි. | ආදායම වැඩි කර ගැනීමට කටයුතු කරන බව. | මහජනතාවගේ සුභසාධන කටයුතු පවත්වා ගනිමින් වියදම් කළමනාකරණය කරගත යුතුය. |